**<u>වර්ෂ 2022 ක් වූ ජූලි මස 21 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව</u>**

<u>පැමිණීම</u>

01. ගරු සභාපති - ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
02. ගරු උප සභාපති - එච්.ඒ නන්දසෝම මහතා
03. ගරු මන්ත්‍රී - වී.මුරලිදරන් මහතා
04. ගරු මන්ත්‍රී - ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
05. ගරු මන්ත්‍රී - ශාන්තලාල් පෙරේරා මහතා
06. ගරු මන්ත්‍රී - ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
07. ගරු මන්ත්‍රී - එච්.ජී මෛත්‍රීපාල මහතා
08. ගරු මන්ත්‍රී - අයි.රාමකිලි මහතා
09. ගරු මන්ත්‍රී - ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
10. ගරු මන්ත්‍රී - කේ.ඕ කුසුම්ලතා මිය
11. ගරු මන්ත්‍රී - එන්.එම් සුසිලා දමයන්ති මිය
12. ගරු මන්ත්‍රී - එච්.ජී මහින්ද ගුණසේකර මහතා
13. ගරු මන්ත්‍රී - එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
14. ගරු මන්ත්‍රී - පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
15. ගරු මන්ත්‍රී - එච්.ඒ.එන්.සී රණසිංහ මහතා
16. ගරු මන්ත්‍රී - එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
17. ගරු මන්ත්‍රී - එස්.එල්.අරුණ ශාන්ත මහතා
18. ගරු මන්ත්‍රී - කේ.ඕ සෝමතිලක මහතා
19. ගරු මන්ත්‍රී - එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

<u>නොපැමිණීම</u>

01. ගරු මන්ත්‍රී - ජී.කේ.පී ෆොන්සේකා මිය

**<u>01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම</u>**

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
2022 ජූනි මස මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 ජූනි මස මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>**

<u>02 - 01 තක්සේරුකරු,රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව,යටිනුවර වීදිය,මහනුවර</u>
සිල්වාස්ලැන්ඩ් පොදු ඉඩමේ කඩ කාමර සඳහා වෙන්කල බිම් කොටස් සඳහා බිම් කුලී තක්සේරු කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 02 ප්‍රධාන විධායක නිලධාරි,ජනතා වතු සංවර්ධන මණ්ඩලය,කොළඹ 02</u>
පොදු කටයුතු සඳහා ඉඩම් කොටසක් ලබා ගැනීම සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 03 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>

සභා අරමුදල් වියදම් කිරිම සඳහා අනුමැතිය ලබා ගැනීම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
ප්‍රාදේශීය සභා ආඥා පනතේ 132(ඔ) වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂයය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 05 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පුස්තකාල සංවර්ධන වැඩසටහන - 2022 මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරිම - මධ්‍යම පළාත යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 ලේකම්,පළාත් සභා,පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය,කොළඹ
2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනතේ 25 වන වගන්තියේ 2 (ඇ) අනුව සංගීත ප්‍රසංග සඳහා බලපත්‍ර නිකුත් කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 07 මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් පාලිකාවන් සඳහා 2021.12.10 හා 2021.12.11 යන දෙදින තුළ පුහුණු වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් රු:79,725.00 ක මුදලක් සභා අරමුදලින් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පළාත් සභා රාජ්‍ය ආයතන වෙත පරිත්‍යාග කරන ඉඩම් වල අයිතිය නියමානුකූල කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 09 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
නඩත්තු/හදිසි ඉදිකිරිම් හා අළුත්වැඩියා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරිම - 2021/2022 වර්ෂය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා,පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව
2022 සභා අරමුදල් සංවර්ධන යෝජනා - 2022.07.21 දිනට ප්‍රගතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 11 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පූර්ණ පරික්ෂණ වාර්තාව - 2020 වර්ෂය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**03. මහජන පෙත්සම්,පැමිණිලි හා ලිපි සභාගත කිරිම**
නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**
නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**
05 - 01 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
රොසැල්ල ටෙම්පල්ස්ටෝ වත්ත වොලිබෝල් ක්‍රීඩා පිටියේ විදුලි සම්බන්ධතාවය හා විදුලි බල්බ සවි කිරිම සඳහා සභා අරමුදල් ප්‍රතිපාදන වලින් 2022 වර්ෂයේ පසුගිය සභාවේ අනුමත වූ රු:100,000.00 ප්‍රතිපාදන මුදල් ඒ සඳහා ප්‍රමාණවත් නොවන හෙයින් මාගේ සභා අරමුදල් වලින් රු:160,000.00 මුදලක් වොලිබෝල් ක්‍රීඩා පිටියේ විදුලි සම්බන්ධතාවය හා විදුලි බල්බ සවි කිරිම සඳහා ලබා දීම සුදුසු බවත් රු:30,000.00 මුදලක් බෝධිරාජ විහාරස්ථානය සඳහා පිගන් භාණ්ඩ ලබා දීම සඳහා ලබා දීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සදහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සදහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 02 ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
2022 වර්ෂය සදහා මා වෙත වෙන් කරන ලද මුදලින් බලංතොට නවශාන්තගම සුභසාධක සමිතියේ ඉදිකරගෙන යනු ලබන ගොඩනැගිල්ල සදහා දිග අඩි 12 ඇස්බැස්ටස් තහඩු 08 ක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සදහා අනුමැතිය ලබා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 03 ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
2022 වර්ෂය සදහා මා හට ලැබෙන ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් මා විසින් මීට පෙර යෝජනා ඉදිරිපත් කරන ලද පහත සදහන් සංවර්ධන යෝජනා ඉටු නොකරන බවත් එම මුදල් වෙනත් කටයුත්තක් සදහා යෙදවීමට ඉදිරියේදී කටයුතු කරන බවත් සභාවට ඉදිරිපත් කරන අතර ඒ අනුව පහත යෝජනා අවලංගු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 04 ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලට අදාල යෝජනා පහත සදහන් ආකාරයට සංශෝධනය කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

- වරකාව ගම මැද පාර මුල කොටස කඩතොලු වැසීම සදහා රු:125,000.00
- වරකාව ශ්‍රී සුන්දරාරාම විහාරස්ථාන මලුවට කැට ගල් ඇල්ලීම සදහා රු: 100,000.00
- වරකාව ගම් සභා පාර මුල් කොටස සංවර්ධනය කිරිම රු: 75,000.00

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව වරකාව ශ්‍රී සුන්දරාරාම විහාරස්ථාන මලුවට කැටගල් ඇල්ලීම සදහා වන යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සදහා යොමු කිරිම සුදුසු බවටත් අනෙක් යෝජනා සදහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවටත් ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 05 ගරු මන්ත්‍රී එච්.ඒ.එන්.සී රණසිංහ මහතා
මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලට අදාල යෝජනා ක්‍රියාත්මක කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

- පල්ලේගම ශ්‍රී නන්දනාරාම පුරාණ විහාරස්ථානයේ විහාර මන්දිරයේ ඉදිකිරිම් වැඩ කටයුතු සදහා රු: 50,000.00
- වැවේගම ඉහළ ගල්පොත්ත පිහිල්ල සංවර්ධනය සදහා රු: 50,000.00

ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව පල්ලේගම ශ්‍රී නන්දනාරාම පුරාණ විහාරස්ථානයේ විහාර මන්දිරයේ ඉදිකිරිම් වැඩ කටයුතු සඳහා වන යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවටත් අනෙක් යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවටත් ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 06 ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
මාගේ සභා අරමුදල් වලින් පහත සඳහන් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

- දෙකිද සුභසාධක සමිතියට ශබ්ද විකාශන යන්ත්‍ර ලබා දීම සඳහා රු:100,000.00
- දෙකිද ධම්මරථන විදුහලේ පඩිපෙළ සංවර්ධනය සඳහා රු:100,000.00

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව දෙකිද සුභසාධක සමිතියට ශබ්ද විකාශන යන්ත්‍ර ලබා දීම සඳහා වන යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවටත් අනෙක් යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවටත් ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 07 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා වන අයවැය ඉදිරිපත් කිරිම සඳහා වන අයවැය කාලසටහන මේ සමග ඉදිරිපත් කරන අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය ලේකම්තුමා විසින් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව අංක 122,බෝදාදෙනිය,මීපිටිය,නාවලපිටිය යන ලිපිනයේ පදිංචි එන්.ජී නිහාල් රූපසිංහ මයාගේ ඉඩමේ පවතින අනතුරුදායක වතුර මාර ගසක් හා දවට ගසක් ඉවත් කරන ලෙස දන්වා ඇති අතර ඒ අනුව ප්‍රාදේශීය සභා ආඥා පනත අනුව එම ගස් ඉවත් කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සභාව සතු 31-9698 දරණ ජීප් රථයේ එන්ජිම තුළ සිදු වූ දෝෂයක් හේතුවෙන් එම වාහනය 2021.08.01 දින සිට ධාවනයෙන් ඉවත් කර තිබුණි.තවද මෙම වාහනයේ එන්ජිම අලුත්වැඩියා කිරිමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නාවලපිටිය ඩිපෝවේ යාන්ත්‍රික ඉංජිනේරු වෙතින් නිර්දේශ ලබා ගෙන පහත සඳහන් ක්‍රියාමාර්ගය සිදු කර ඇති බව දන්වා සිටිමි.

- 2021.11.30 දින යාන්ත්‍රික ඉංජිනේරුගෙන් නිර්දේශ ලබා ගෙන එම ලිපිය මහා සභාවේ සභාගත කර ඇත.
- ඒ අනුව එම වාහනයේ එන්ජින් පද්ධතිය අලුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් සඳහා හා ඒ සඳහා වන ගරාජ් කුලිය පිළිබඳ මිල ගණන් කැඳවා එම මිල ගණන් 2022.01.27 දින මහා සභාවට ඉදිරිපත් කර ඇත.
- එම සභා තීරණය අනුව රැස්වූ යාන්ත්‍රික ඉංජිනේරු ඇතුළු තාක්ෂණික ඇගයීම් කමිටුවේ තීරණයක් වන්නේ මෙම වාහනය සඳහා වන Recondition එන්ජිමේ මිල ගණන් හා අලුත්වැඩියාව සඳහා වැය වන මුදල හා සන්සන්දනය කිරිම තුළින් අවම වියදමින් මෙම වාහනය ධාවන තත්ත්වයට රැගෙන ඒමයි.
- ඒ අනුව Recondition එන්ජිම සඳහා මිල ගණන් කැඳවා එම මිල ගණන් 2022.02.24 දින මහා සභාවට ඉදිරිපත් කර ඇත.
- එම සභා තීරණය අනුව නැවත රැස්වූ තාක්ෂණික ඇගයීම් කමිටුව වාහන අලුත්වැඩියාව සඳහා වියදම රු:390,000.00 හා Recondition එන්ජිම සවි කිරිම සඳහා වන වියදම රු:75000.00 වන බව නිරික්ෂණය වුනි.මෙම මිල ගණන් සන්සන්දනය තුළින් Recondition එන්ජිම සවි කිරිම සභාවට වියදම අඩු කිරිමට හැකි බව හා මෙම වාහනයේ පැවැත්ම තව වැඩි කිරිමට හැකි වන කරුණු සලකා බලා Recondition එන්ජිම සවි කිරිම සුදුසු බවට තීරණය කර ඇත.
- ඒ අනුව අදාල ආයතනයෙන් Recondition එන්ජිම මිලදී ගෙන අලුත්වැඩියාව සිදු කර පරික්ෂණය සඳහා 2022.06.28 දින ලංකා ගමනාගමන මණ්ඩලයේ නාවලපිටිය ඩිපෝවේ යාන්ත්‍රික ඉංජිනේරු වෙත යොමු කර ඇත.එම වාහනය පරික්ෂා කළ යාන්ත්‍රික ඉංජිනේරුතුමා විසින් මෙම අලුත්වැඩියාව සාර්ථකව නිම කර ඇති බව නිර්දේශ කර ඇත.
- එම නිසා වාහනය අලුත්වැඩියාව සඳහා වියදම් වූ රු:465,000.00 මුදල ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව උක්ත මුදල ගෙවීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022.07.03 වන දින හෛඩ්‍රි වත්තේ ගංවතුර හේතුවෙන් ආපදාවට ලක් වූ ජනතාවට ආහාර පිළියෙල කිරිම සඳහා ආහාර ද්‍රව්‍ය ලබා දුන් අතර ඒ සඳහා රු:12235.00 මුදලක් වැය වූ අතර එම මුදල ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත වියදම සභාව මගින් ගෙවීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සභාවට අයත් ගල් කොරිය කරගෙන යාමේදී පවතින අර්බුදකාරී තත්ත්වය මත සියලු වියදම් ඉහල යාම හේතුවෙන් සභාවට ගෙවිය යුතු මාසික ගාස්තුව ගෙවීමේද අපහසු තත්ත්වයක් පැන නැගී ඇති බැවින් ඒ යම් සහනයක් ලබා දෙන මෙන් සුමංගල මාවත,කුරුණෑගල ලිපිනයේ පදිංචි ඊ.එම්.ඩී.කේ ඒකනායක මහතා විසින් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව එම කරුණු සැලකිල්ලට ගෙන මෙම මස පමණක් ගල්වලේ මාසික කුලිය රු:150,000.00 අය කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එච්.පී මහින්ද ගුණසේකර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා ලැබූ මහා සභාව සභාව සතු ගල්වල සඳහා මාසික කුලිය වශයෙන් රු:150,000.00 මුදලක් මෙම මස පමණක් අය කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගලමුදුන ජනපද කුඩා තේ වතු සංවර්ධන සමිතියේ සභාපතිතුමා විසින් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව ගලමුදුන වත්ත 6 කණුව පොදු ඉඩමේ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට හා ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිල්ල ඉදිකර දීමට කුඩා තේ වතු සංවර්ධන මහනුවර කාර්යාලය කැමැත්ත පළ කර ඇති බැවින් ඒ සඳහා ඉඩම භාවිත කිරීම වෙනුවෙන් සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ලිපියක් ලබා දෙන මෙන් ඉල්ලා සිටින අතර එම ලිපිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 13 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පෙර පාසලක් ආරම්භ කිරීම සඳහා අවසර ලබා ගැනීම යන මැයෙන් අංක 67,ශාන්ත ජනපදය,බලංතොට ලිපිනයේ පදිංචි ඊ.ජී චමිලා කුමාරි මිය විසින් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව ඇය විසින් පෙර පාසල පවත්වා ගෙන යාම සඳහා බලංතොට උතුර ප්‍රජා ශාලාව ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇති අතර සභාව සමග ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු එම ප්‍රජා ශාලාව පෙර පාසල පවත්වා ගෙන යාම සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
රැස්වීමක් වත් තියාගන්න අපිට වෙන තැනක් නෑ සභාපතිතුමා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පෙර පාසල ඉවර උනාට පස්සේ රැස්වීම් තියාගන්න පුලුවන්.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
හයින්ෆෝඩ් බී ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයේ විහාරාධිකාරි කටු කිතුලේ සෝමරතන ස්වාමීන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය වෙනුවෙන් රු:20,500.00 ක මුදලක් වියදම් වී ඇති බැවින් එම මුදල සභා අරමුදල් මගින් වියදම් දැරීම සුදුසු බවටත් අනුමැතිය සඳහා මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
හෙඩ්ලි ෆාම් වත්තට යන මාර්ගයේ ඇති පැරණි පාලම හේතුවෙන් එම පාලම කඩා වැටී දිය පහරට බාධා පැමිණීම හේතුවෙන් අවට නිවාස හා ජීවිත වලට විශාල හානියක් සිදු වීමේ ඉඩකඩක් පවතිනවා.එම නිසා එම පාලම කඩා ඉවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හෙඩ්ලි ෆාම් වතු අධිකාරි වෙත ලිපියක් යොමු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරීම.**

06 - 01 මුදල් කාරක සභාව - 2022.07.21
06 - 02 නිවාස ප්‍රජා සංවර්ධන කාරක සභාව - 2022.07.14
06 - 03 කාර්මික සේවා කාරක සභාව - 2022.07.14
06 - 04 පරිසර හා පොදු පහසුකම් කාරක සභාව - 2022.07.14
06 - 05 ගැටුම් සමථකරණ කාරක සභාව - 2022.07.14

07. **බැංකු සැසඳුම් ප්‍රකාශය,අභ්‍යන්තර විගණන වාර්තාව,ලැබීම් සාරාංශය,ගෙවීම් සාරාංශය,ගෙවීම් වාර්තාව,පුස්තකාල ප්‍රගතිය,ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම**

- 2022.06.01 දින සිට 2022.06.30 දක්වා වවුචර් අංක 602 සිට 718 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.
- බැංකු සැසඳුම් ප්‍රකාශය

ගිණුම් අංකය - 053100164889286
මාසය - 2022 ජූනි

| | | | |
|---|---|---|---|
| 2022.06.01 දිනට මුදල් පොතේ ශේෂය | රු: | 3,749,829.82 | |
| එකතු කළා ජූනි මස මුළු ලැබීම් | රු: | 5,049,590.52 | |
| අඩු කළා ජූනි මස මුළු ගෙවීම් | රු: | 6,503,147.15 | |
| 2022.06.30 දිනට මුදල් පොතේ ශේෂය | | | රු: 2,296,273.19 |
| <u>එකතු කළා</u> | | | |
| නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | රු: | 1,076,441.96 | |
| | | | රු: 1,076,441.96 |
| | | | 3,372,715.15 |
| <u>අඩු කළා</u> | | | |
| බැංකු ගාස්තු | රු | 112.00 | |
| අත ඉතිරි මුදල් | රු: | 76,784.40 | |
| | | | රු: 76,896.40 |
| 2022.06.30 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | | **රු:3,295,818.75** |

- 2022 ජූනි මස ගෙවීම් සාරාංශය

| විස්තරය | මුදල (රු) |
|---|---|
| 01. වැටුප් හා දීමනා | 3,323,284.38 |
| 02. ගමන් වියදම් | 35,606.00 |
| 03. සැපයුම් හා උපකරණ | 635,226.00 |
| 04. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 228,392.94 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 106,404.57 |
| 06. පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 22,749.12 |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 15,192.20 |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 15,183.16 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | **4,382,038.37** |

| | |
|---|---|
| 09. ප්‍රාග්ධන වැය | 371,773.24 |
| 10. ණය ආපසු ගෙවීම් | 232,432.74 |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **604,205.98** |
| **පුන:වැය හා ප්‍රාග්:වැය මුළු එකතුව** | **4,986,244.35** |
| විවිධ ණය හිමියන් | 411,590.00 |
| කර්:ණය හිමියන් (309-3-1) | 110,360.00 |
| කර්:ණය හිමියන් (309-3-111) | 115,755.00 |
| කර්:ණය හිමියන් (304-5) | - |
| 10% කර්මාන්ත තැම්පත් | 560,315.29 |
| විවිධ තැම්පත් | 143,121.16 |
| මුද්දර තැම්පත් | 48,600.00 |
| දේපල ණය | 12,747.17 |
| සේවක ණය | 24,933.00 |
| අත්තිකාරම් | 88,000.00 |
| සමුච්චිත අරමුදල | - |
| ලිපි ද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | 64,100.00 |
| ජල ගබඩා අත්තිකාරම් | 390,336.00 |
| අගරු චෙක්පත් | |
| කර්:ණය ගැතියන් | |
| **එකතුව** | 1,969,857.62 |
| **2022.06.30 දක්වා මුළු ගෙවීම් එකතුව** | **6,956,101.97** |

- 2022 ජූනි මස ලැබීම් සාරාංශය

| • අය විෂයය නාමයන් | මුදල (රු) |
|---|---|
| 10 වරිපනම් හා බදු | 595,869.50 |
| 20 කුලී | 45,908.80 |
| 30 බලපත්‍ර ගාස්තු | 59,408.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 212,961.40 |
| 50 වරෙන්තු ගාස්තු | 499,415.54 |
| 60 වෙනත් ආදායම් | 408,472.29 |
| 70 වෙනත් ආධාර | 3009,923.70 |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් එකතුව | **4,831,959.23** |
| ජල ණය ගැතියෝ | 4,348.00 |
| ජල තැම්පත් | 5,500.00 |
| මුද්දර | 4,050.00 |
| විවිධ තැම්පත් | 148,974.63 |
| සේවක ණය | 212,119.00 |
| කර්මාන්ත තැම්පත් | 29,921.32 |
| දේපල ණය | 12,747.16 |

| | |
|---|---|
| විවිධ ණය ගැතියෝ | 46,790.00 |
| අත්තිකාරම් පියවීම | 28,060.00 |
| අත්තිකාරම් පියවීම ජල ගබඩා | 176,476.00 |
| රු 25 මුද්දර | 1,600.00 |
| සැලසුම් හා උපකරණ | |
| කර්මාන්ත ණය ගැතියෝ | |
| වෙනත් ලැබීම් වල එකතුව | 670,586.11 |
| 2022.06.30 දක්වා මුළු ලැබීම් | **5,502,545.34** |

- 2022 ජූනි මස පුස්තකාල ප්‍රගතිය

01. නව සාමාජික සංඛ්‍යාව - 07
02. සාමාජිකත්වය අලුත් කළ සංඛ්‍යාව - 17
03. පොත් බැහැර දීම - 1085
04. ව්‍යාප්ත සේවා -
05. රැස්කළ ආදායම(පුස්තකාල)- 2150.00
(නැණසල) - 1000.00

**08.<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

08 - 01 RD 6662 ට්‍රැක්ටර් රථය සඳහා ටයර් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| විස්තරය | යූනියන් එන්ටර්ප්‍රයිසස්,කොත්මලේ පාර,නාවලපිටිය | කොත්මලේ ටයර් හවුස්,ගම්පොල පාර,නාවලපිටිය | ස්ටෙනෝර් ටයර් හවුස්,කොත්මලේ පාර,නාවලපිටිය |
|---|---|---|---|
| 600 - 16 සියැට් ටයර් 02 | 58,800.00 | 58,300.00 | 59,300.00 |
| 700 - 16 ටියුබ් 02 | 9,000.00 | 8,500.00 | 9,500.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "කොත්මලේ ටයර් හවුස්,ගම්පොල පාර,නාවලපිටිය" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 02 WPPF 7405 දරණ කැබ් රථය අලුත්වැඩියා කිරිම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | කමල් මෝටර්ස්,මීපිටිය,නාවලපිටිය | නාවලපිටිය ඔටෝ කෙයාර්,නාවලපිටිය | උදාර මෝටර්ස්,ඉඹුල්පිටිය, නාවලපිටිය |
|---|---|---|---|
| Upper Arm Ball Joint | 21,000.00 | 19,550.00 | 22,000.00 |
| Lower Arm Ball Joint | 16,500.00 | 15,400.00 | 17,500.00 |
| Front Socket Sober | 44,000.00 | 43,200.00 | 45,000.00 |
| Rear Socket Sober | 41,500.00 | 40,420.00 | 41,900.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "නාවලපිටිය ඔටෝ කෙයාර්,නාවලපිටිය" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 03 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දහම් පාසල් පුස්තකාල සඳහා උපකරණ මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම

| විස්තරය | ජයන්ති ටිම්බර් ඩිපොට්,නාවලපිටිය | සමගි ෆර්නිචර්ස්,නාවලපිටිය | මිත්‍රානි ඩිස්ට්‍රිබියුටර්ස්,නාවලපිටිය |
|---|---|---|---|
| ඇදි රහිත ප්ලාස්ටික් පුටු | 3500.00 | 3485.00 | 3490.00 |

| | | | |
|---|---|---|---|
| නිල්කමල් | | | |
| ප්ලාස්ටික් මාවල් මේස නිල්කමල් | 12000.00 | 11700.00 | 11950.00 |
| මෙලමයින් පුස්තකාල වීදුරු කබඩ් | 43500.00 | 42500.00 | 43000.00 |
| 8*4 තේක්ක ලී මේස | 68000.00 | 67500.00 | 69000.00 |
| පියෙස්ට්‍රා පුටු | 9200.00 | 9130.00 | 9400.00 |
| මෙලමයින් පොත් රාක්ක | 26500.00 | 25750.00 | 26000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "සමගි ෆර්නිචර්ස්,නාවලපිටිය" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 04 වරකාව ප්‍රජා ශාලාවේ කියවීම් ශාලාවක් සකස් කිරිම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| ද්‍රව්‍යය | ග්ලාස් හවුස්,නාවලපිටිය | සිටි හාඩ්වෙයාර් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්,නාවලපිටිය | සිටි ග්ලාස් ඇන්ඩ් ඇළුමිනියම්,නාවලපිටිය |
|---|---|---|---|
| හාඩ් බෝර්ඩ් | 2150.00 | 2100.00 | 2050.00 |
| කම්බි ඇණ අඟල් 1 | 95.00 | 90.00 | 85.00 |
| කම්බි ඇණ අඟල් 2 | 90.00 | 90.00 | 85.00 |
| කම්බි ඇණ අඟල් 3.5 | 90.00 | - | 85.00 |
| සරනේරු අඟල් 3 | 180.00 | 130.00 | 120.00 |
| ඉබි යතුරු | 450.00 | 300.00 | 275.00 |
| 48*18 ප්ලේන් වීදුරු නූල් 2 | 2400.00 | 2400.00 | 2370.00 |
| 18*12 ප්ලේන් වීදුරු නූල් 2 | 650.00 | 600.00 | 592.50 |
| නො 06 වෝල් ප්ලග් | 2.50 | 1.75 | 1.50 |
| නො 08 වෝල් ප්ලග් | 3.50 | 2.75 | 2.50 |
| 12W LED | 1800.00 | 1600.00 | 1550.00 |
| 13 AMP Plug | 950.00 | 925.00 | 885.00 |
| 3 Gan Swich | 650.00 | 490.00 | 470.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "සිටි ග්ලාස් ඇන්ඩ් ඇළුමිනියම්,නාවලපිටිය" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 05 ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | කැන්ඩි ස්ටෝර්ස්,නාවලපිටිය | ශ්‍රී ගෞරීස්,නාවලපිටිය | ශ්‍රී ලංකා ස්ටෝර්ස්,නාවලපිටිය |
|---|---|---|---|
| වොලිබෝල් නෙට් | 5100.00 | 4950.00 | Micassa – 4750.00<br>Gold Cup – 3150.00 |
| ක්‍රිකට් බැට් | 4250.00 | 3900.00 | 3525.00 |
| ටෙනිස් බෝල | 3927.50 | 3750.00 | Tin – 660.00<br>No Tin – 3600.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "ශ්‍රී ලංකා ස්ටෝර්ස්,නාවලපිටිය" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 06 ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | Champa Stors,Kandy | PaperLine Trading (Pvt)Ltd,Kandy | Weerarathna Industries(Pvt)Ltd,Kandy |
|---|---|---|---|
| Spike Shoes | 7960.00 | 9900.00 | 10260.00 |
| Jogging Shoes | 8960.00 | 9900.00 | 10260.00 |

| | | | |
|---|---|---|---|
| Yoga mat | 2260.00 | 3200.00 | 3560.00 |
| T Shirt | 2360.00 | 2560.00 | 2980.00 |
| Bottom | 1760.00 | 2260.00 | 2700.00 |
| Tight Short | 650.00 | 760.00 | 980.00 |
| Water Bottle | 1960.00 | 2560.00 | 2980.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “Champa Stors,Kandy” යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

**09. වෙනත් කරුණු**
නැත

සාකච්ඡා කිරිමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි පිරිසට ස්තූතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.30 පමණ අවසන් කරන ලදී.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>
මහ වැස්සට හෙඩ්‍රි වලට ගංවතුර ආවා.පවුල් 18 පන්සලට ගියා.ගෙවල් දෙකක් සම්පූර්ණයෙන්ම කැඩිලා තිබුණා.කුකුලෝ 100 විතර වතුරට ගහගෙන ගියා.අපේ ඇමතිතුමා ගොඩක් උදව් කරා.ඒකට ස්තූතිවන්ත වෙනවා.මමත් හිටියේ නෑ.මං සභාපතිතුමාටයි ප්‍රාදේශීය ලේකම්තුමාටයි ඇමතිතුමාටයි කථා කරා.පාලම කඩන්න ඕනි.නැත්නම් ආයෙත් මෙහෙම දෙයක් වෙයි.මීට වඩා ජීවිත හානි වෙයි නැත්නම්.

<u>ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි</u>
එයාලාට ඉඩම් කොටසක් හරි වෙන් කරලා දෙන්න පුලුවන් නම් හොදයි.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>
ඉඩම් දෙනවා කියලා කිව්වා නමුත් එයාලා ගෙවලුත් හදලා ඉල්ලනවා.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
පැරණි ප්‍රාදේශීය සභාවේ අවධානම් ගස් ටිකක් තියෙනවා.ඒ ටික කපලා ඉවත් කරනන පුලුවන් නම් හොදයි.

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>
වැලිගම්පොල වැල් පාලම කඩා වැටිලා දැන් හදලා ඉවරයි.මේ වෙනකොට ගඟේ වතුර ඇවිල්ලා පාලමේ එහා පැත්තේ බැම්මේ වදිනවා.තව මහ වැස්සක් ආවොත් පාලමේ කණුවක් ගැලවිලා යනවා.ජේසීබී එකෙන් කැපුවොත් පාලම ආරක්ෂා කරගන්න පුලුවන්.වැලිගම්පොල ශ්‍රී බෝධිරුක්ඛාරාමයේ ස්වාමීන් වහන්සේ අපවත්වූ වෙලාවේ උදව් උපකාර කළ ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාට ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම වැලිගම්පළ වෙඩරුවේ ළිඳ අසල වතුර බටයක් කැඩිලා.ඒකත් සකස් කරන්න ඕනි.දවස් 4ක් වතුර බටේ කැඩිලා.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
රනිල් වික්‍රමසිංහ මහතාට පළමුව සුභාශිංසන පිරිනමනවා.රටේ ජනතාව මේ දුෂ්කරතා වලින් මුදවා ගැනීමට හැකි වේ යැයි සිතමින් පාර්ලිමේන්තු ජන්දය භාවිත කරන්න ඇති කියලා හිතනවා.ඩලස් අලහප්පෙරුම මැතිතුමා ජන්දයෙන් තේරී පත් වෙයි කියලා හිතුවට කිසිදු ජන වරමක් නැති පාර්ලිමේන්තුවට ජාතික ලැයිස්තුවෙන් තේරී පත්වූ රනිල් වික්‍රමසිංහ මැතිතුමා තමයි ජනාධිපති උනේ.ලෝක දේශපාලන ඉතිහාසයේ වාර්තාවක් තැබූ කෙනෙක්.ආර්ථික අර්බුදයෙන් ජනතාව පීඩාවට පත් වෙලා.කිසිදු ප්‍රතිලාභයක් නැතුව වෙනත් රටවල් අපිට උදව් කරලා තියෙනවා.රටවල් දැන් අපේ රටට ණය දෙන්නේ නෑ.අපේ රටින් ගිය විදේශ ශ්‍රමිකයාත් අපිට උදව් කරන්නේ නෑ.ජාත්‍යන්තර සම්බන්ධතා තියෙන ජනාධිපති කෙනෙක් කියලා කිව්වට අපිට එහෙම දෙයක් පේන්නේ නෑ.ජනතාවගේ මූලික අවශ්‍යතාවත් ඉටු කරලා දෙන්න පුලුවන් උනොත් හොදයි.සභාවක් විදියට අපිටත් ජනතාවට සහනයක් ලබා දෙන්න බැරි වෙයි.මූලික ගැටලු ටික විසදා ගැනීමට ජනාධිපතිතුමාට හැකි වේ යැයි විශ්වාස කරනවා.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
පරිසර කමිටුවට මමත් දමයන්ති මන්ත්‍රීතුමියත් පත් කර ගන්න කියලා කිව්වට තවම පත් කර ගත්තේ නෑ.කනගාටුවෙන් උනත් කියන්න ඕනි වැවේගම වතුර පාර කඩලා තියෙන්නේ මගේ මහත්තයා කියලා ලේකම්තුමියට කියලා තියෙනවා.මගේ ගෙදරට යන වතුර පාර මං කඩා ගන්නේ නෑ.කවුරු කරත් කමක් නෑ නීතිය ක්‍රියාත්මක කරන්න.පෞද්ගලික මට වාසි ගන්න නෙවෙයි මං දෙයක් කරන්නේ.සභාවට ලොකු ආදායමක් එන වැඩක් තමයි මං කරේ.මගෙන් පලිගන්න තමයි මේ වැඩ ඔක්කොම කරන්නේ.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
අලුතින් පත් උන ජනාධිපතිතුමා අද දිව්රුම් දුන්නා.දුවන කෝච්චියට බෙල්ල තිබ්බා වගේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රට භාරගත්තා.ජනතාව ලොකු ආර්ථික අර්බුදයක ඉන්නවා මේ වෙනකොට.මෙතුමා විතරයි මේ අභියෝගය භාර ගත්තේ.එතුමා ඉවසීමෙන් වැඩ කරපු නිසා තමයි විධායක ජනාධිපති ධූරයට පත් වෙන්න පුලුවන් උනේ.එතුමාගේ පාලන කාලය තුළ අපිටත් යහපත් ජීවිතයක් ගත කරන්න ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් එතුමාට ස්තුතිවන්ත වෙමින් මං නිහඬ වෙනවා.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා
අභිනව ජනාධිපතිතුමාට විශාල කාර්යභාරයක් පැවරිලා තියෙනවා.හිටපු ජනාධිපතිතුමා සියලු දෙනාට සර්ව පාර්ශික ආණ්ඩුවකට කථා කරා.නමුත් කවුරුත් ආවේ නෑ.රට මේ තත්ත්වයට පත් කරේ ජනතා විමුක්ති පෙරමුණත් සජිත් මහත්තයාගේ පක්ෂයත්.අරගලය මෙහෙය වූවේ එතුමන්ලා.ජනතා විමුක්ති පෙරමුණ තමයි මේ ආර්ථික අර්බුදයට මූලික හේතුව.ජනතා විමුක්ති පෙරමුණේ නායකයින්ට කියන්න දැන්වත් කකුලෙන් අදින්නේ නැතුව රට පවත්වා ගෙන යන්න අවස්ථාවක් දෙන්න කියලා.සභාවේ මන්ත්‍රීවරුන්ගෙනුත් ඉල්ලා සිටින්නේ පක්ෂ භේද නැතුව මේ රට වැටිලා තියෙන අගාධයෙන් ගොඩ එන්න එකතු වෙන්න කියලා.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
උදේ කෑමට විතරක් 150,000.00 යනවා.දවසේ කෑමට කොච්චර යනවා ඇතිද.කවුද මේවා දෙන්නේ.උද්ඝෝෂණය කරන අය පිටිපස්සේ ඉන්නේ කවුද.මේවා හොයලා තමයි කවුරු හරි උද්ඝෝෂණය කරනවා නම් කරන්න ඕනි.නීතියක් දැම්මා අරගල භූමියෙන් දරුවන් ඉවත් කරගන්න කියලා.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
කිසිම පාලකයෙක් පොලීසියේ හෝ අධිකරණයේ ස්වාධීනත්වය පවතිනවාට කැමති නෑ.ඒකට හේතුව කරපු දූෂණ වංචා සියල්ල අහු වෙනවා.අනුර කුමාර මැතිතුමාට අගමැතිකම භාර ගන්න කියලා කිව්වා.නමුත් කොන්දේසි දාලා.ඒ කොන්දේසි වලට එකඟ වෙන්න බෑ.පාර්ලිමේන්තුව පිළිබඳ විශ්වාසයක් ජනතාවට නෑ.තුවක්කුවෙන් මෙල්ල කරන්න පුලුවන් ජනතාවක් දැන් නෑ.ලෝකය අපි දිහා බලා ඉන්නවා.අගමැති වෙලා ඉන්න කාලේ මොනවද කළේ.බටලන්දේ කොහොමද දරුවෝ මැරුවේ කියලා විස්තර තියෙනවා.අපි සියලු දෙනා සාමාන්‍ය ජනතාව.ආර්ථික අර්බුදය සියලු දෙනාට එක වගේ බලපාන්නේ.අපි ජීවත් වෙන්නේ සුන්දර රටක නෙවෙයි.කැපකිරීම් කරන්න පුලුවන් දේශපාලඥයින් බිහි වෙන්නේ නෑ.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
මෙතුමා කිව්වා අගමැති කාලේ මොනවද කරේ කියලා.එතුමාට හැමදාම විධායක ජනාධිපති කෙනෙක් යටතේ තමයි ඉන්න උනේ.ඊට ඉහලින් වැඩ කරන්න බෑ.සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ කාලයේ වැඩ කරන්න ලැබුනේ නෑ ජනතා විමුක්ති පෙරමුණ නිසා.71 කරන්න දුන්නෙත් නෑ.අරගල පිටිපස්සේ ඉන්නේ කවුද කියලත් දන්නවා.මෙතුමාටත් මාස 06ක් කරන්න දෙමු.ඊට පස්සේ බලමු මොකක්ද වෙන්නේ කියලා.

ගරු මන්ත්රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
74 සිරිමාවෝ මැතිණිය වගා සංග්‍රාමය පටන් ගත්තේ.71 කැරැල්ල නිසා ඒක කරගන්න බැරි උනේ නෑ.6 වතාවක් අගමැති වෙලා මොනවද කරන්න පුලුවන් උනේ.හොරකමට සහයෝගය දක්වපු එක විතරයි කරේ.මහ බැංකු වංචාවම මදිද කරපු හොර වැඩ කියන්න.71 හා 88,89 සමාජ අරගලයේ පාඩුව මහ බැංකු පාඩුවට සම කරන්න බෑ.සමාජ අරගලයකදී එහෙම දේවල් වෙනවා.මාස 6 කින් අනිවාර්යයෙන් ඡන්දයක් තියන්න වෙනවා.ගෝඨාභය ජනාධිපතිතුමා ගියා වගේ නෙවෙයි රනිල් වික්‍රමසිංහ මහතාට යන්න වෙන්නේ.වයසට ගියාම වත් පිනක් දහමක් කරගෙන ඉන්න ඕනි.තමුන්ගේ ගේ තමුන්ම ගිනි තියාගන්නවා.එහෙම වැඩ කරන්න එපා.

ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
මේකට ගියේ එක පක්ෂයකින් නෙවෙයි.හැම පක්ෂයකින්ම ගියා.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා
අරගලකරුවන් කිව්වේ 225 එපා කියලා නම් මෙතුමාගේ නායකතුමාට විතරක් යන්න පුලුවන් උනේකොහොමද

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී.පුෂ්පකුමාර මහතා</u>
අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නිහතමානී නායකයෙක් විදියට එතුමාගේ ජනාධිපති ධූරය අතහැරියා.අපි එතුමාට ස්තූතිවන්ත වෙන්න ඕනි එතුමාගේ කාලයේදී එතුමා කරපු සේවය සම්බන්ධයෙන්.එතුමා ජනාධිපති උනේ 69 ලක්ෂයකින්.ඉන්දියාවේ පාරවල් ගානේ මැරිලා වැටෙනකොට ලංකාවේ ජනතාවට දෙන්න පුලුවන් උපරිම සහන දීලා මේ ව්‍යවසනයෙන් ජනතාව බේරා ගත්තා.අපිට තියෙන එකම වැරැද්ද පසුගිය දේවල් අමතක වෙන එක.කොවිඩ් නිසා රට ආර්ථික අර්බුදයකට මුහුණ දුන්නා.නමුත් ඒකෙන් ගොඩ යන්න කවුරුත් එතුමට උදව් කළේ නෑ.තමුන්ට වාසි ගන්න තමයි වැඩ කරේ.අපිත් මේ ආර්ථික අර්බුදයට මුහුණ දුන්නා.තවම එතුමට ජන්ද දීපු මිනිස්සු එතුමව හැර ගිහිල්ලා නෑ.එතුමා දැඩි තීන්දු තීරණ ගත්තේ නෑ.එහෙනම් අරගලකරුවන් නෑ මේ වෙනකොට.එතුමා අරගලකරුවන්ට ඉඩ දීලා ගියා.නිහතමානී නායකයෙක් එතුමා.රනිල් වික්‍රමසිංහ මහතාට ස්තූතිවන්ත වෙන්න ඕනි අභියෝගය භාර ගත්තට.ඉදිරිය හොඳ වෙයි කියලා මං හිතනවා.අරගලය දැන් ඇති.අරගලකරුවන් අරගලය කරා විතරයි එන්න ඕනි නායකයෙක් ගැන කියන්නේ නෑ.අරගලයෙන් වෙන්නේ ආර්ථිකය බින්දුවට වැටෙන එක.දේශපාලන වාසි පැත්තක තියලා රට ගොඩනගන්න වැඩ කරන්න ඕනි.රනිල් මහත්තයාටත් මේ වැඩේ කරන්න දුන්නේ නැත්නම් අපිට වෙන්නේ හැමදාම මේ විදියට දුක් විදින්න.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
අරගලවලට ගිහින් හොදට බැට කාපු අය අපි.අපි අපිවත් එකතු වෙලා වැඩ කරමු.මං කොළඹ ඉන්නකොට අරගලයට ගියා.අරගලය කියලා කිය කිය ඉඳලා වැඩක් නෑ.දැන් අපිට තියෙන්නේ රට ගොඩ නගන්න.දැන්වත් එකතු වෙමු.රටේ දරුවන් ගැන හිතමු.අතීතයේ ලොකු අත්දැකීම් තියෙනවා අපිට.ඉදිරියට එහෙම වෙන්න ඉඩ තියන්නේ නැතුව ඉමු.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
සභාව මැදිහත් වෙලා ජාත්‍යන්තර තායි බොක්සින් වලට අනුග්‍රහය දීලා දරුවෙක් තරඟයකට සහභාගී උනානේ.දැන් ඒ පුහුණුකරුවාගේ තව දරුවෙක් සිංගප්පූරු යන්න තේරිලා තියෙනවා.මං අනුග්‍රාහකයින් දෙතුන් දෙනෙකුටත් කථා කරා.පුලුවන් නම් සභාවෙනුත් යම් උපකාරයක් කරන්න පුලුවන් නම් හොඳයි අවශ්‍යතාවයක් උනොත්.දේශපාලන වශයෙන් යම් යම් අදහස් දක්වනවා දැක්කා.කරපු වැරදි වැඩක් නෑ.අපි ඔක්කොම එකතු වෙලා රට ගොඩ නගමු කියලා මං ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ජනාධිපති ඉවත් වෙන්න පොහොර සම්බන්ධයෙන් ඇති වූ ගැටලුව හොඳටම බලපෑවා.ජනතාව ඒ නිසා පාරට බැස්සා.පසුකාලීනව අපි දැක්කා ඒක දේශපාලනීකරණය වෙනවා.මිනිස්සු පාරට බැස්ස එක පස්සේ අවභාවිතා උනා.1977 පෙර දේශපාලඥයින්ට ලොකු ගෞරවයක් තියෙනවා.සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට මේ රට හදන්න ඕනි කියන උවමනාව තිබුණා.ඒ උවමනාව වර්තමානයේ තිබුණා නම් අපේ රට අද සංවර්ධිත රටක්.1977 වෙනකොට ලංකාව ලෝකයේ වෙනත් රටවලට ණය දීලා තිබුණා.අද වෙනකොට අපි ලෝකයේ දැවැන්තම ණයකාරයෝ.ඒකට දේශපාලන ක්‍රියාකාරකම් අඩුවැඩි වශයෙන් බලපාලා තියෙනවා.වෙනත් රටවල් වලින් යැපෙන රටක් බවට අපි දැන් පත්වෙලා.ඒකට හේතුව පිටරටවල් වලින් ගත්තොත් තමයි කොමිස් නැති වෙන්නේ.ගෝඨාභය ජනාධිපතිතුමා පත් උන ගමන් අවුරුදු එක හමාරක් විතර රට වහලා.එතුමා කිව්වා මේක කළොත් රට පවත්වා ගෙන යන්න බැරි වෙනවා කියලා.නමුත් ඇහුවේ නෑ.ජනාධිපතිතුමා නිහතමානී වැඩි උනා.ව්‍යවස්ථාව අනුව මේ විදියට ජනාධිපතිතුමාට ඉවත් වෙන්න බෑ.තිබුණ තත්ත්වය අනුව එතුමා එහෙම කළා.ජනාධිපතිතුමා සියලු පක්ෂ වලට ආරාධනා කරා මේ ගැටලුව විසඳන්න.නමුත් කවුරුත් ඉදිරිපත් උනේ නෑ.